# පරීක්ෂක වාර්තාව

අදියර III විභාගය - ජුලි 2020

## (302) කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය
(Management Accounting and Finance)

**සමස්ත විග්‍රහය:**

මෙම ප්‍රශ්න පත්‍රය ලකුණු 100 ක් ආවරණය කරමින් කොටස් 3 කින් සමන්විත විය.

1. එකකට ලකුණු 5 බැගින් ලකුණු 20 ක් සඳහා අනිවාර්ය ප්‍රශ්න 4 ක්, **A කොටසේ** ඇතුළත්ය.
2. එකකට ලකුණු 10 බැගින් ලකුණු 30 ක් සඳහා අනිවාර්ය ප්‍රශ්න 3 ක්, **B කොටසේ** ඇතුළත්ය.
3. එකකට ලකුණු 15 ක්, ලකුණු 10 ක් සහ ලකුණු 25 ක් බැගින් ලකුණු 50 ක් සඳහා වූ අනිවාර්ය ප්‍රශ්න 3 ක්, **C කොටසේ** ඇතුළත්ය.

**පොදු නිරීක්ෂණ:**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය. කෙසේවෙතත්, පොදු වැරදි කීපයක් නිරීක්ෂණය විය.

**කොටස් අනුව කාර්යසාධනය:**

ලකුණ 20 ක් සඳහා වූ ප්‍රශ්න 4 කින් **A කොටස** සමන්විත විය. මෙම කොටස සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය. ප්‍රශ්න අනුව මෙම කොටසේ උත්තර ලිවීමේ කාර්ය සාධනය පහත පරිදි විය:

| ප්‍රශ්න අංකය | කාර්යසාධන ඇගයීම |
|---|---|
| 1 | සතුටුදායකයි |
| 2 | අසතුටුදායකයි |
| 3 | සතුටුදායකයි |
| 4 | හොඳයි |

ලකුණ 30 ක් සඳහා වූ ප්‍රශ්න 3 කින් **B කොටස** සමන්විත විය. මෙම කොටස සඳහා ද අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය. ප්‍රශ්න අනුව මෙම කොටසේ උත්තර ලිවීමේ කාර්ය සාධනය පහත පරිදි විය:

| ප්‍රශ්න අංකය | කාර්යසාධන ඇගයීම |
|---|---|
| 1 | හොඳයි |
| 2 | හොඳයි |
| 3 | හොඳයි |

ලකුණ 20 ක් සඳහා වූ ප්‍රශ්න 4 කින් **C කොටස** සමන්විත විය. මෙම කොටස සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය. ප්‍රශ්න අනුව මෙම කොටසේ උත්තර ලිවීමේ කාර්ය සාධනය පහත පරිදි විය:

| ප්‍රශ්න අංකය | කාර්යසාධන ඇගයීම |
|---|---|
| 1 | සතුටුදායකයි |
| 2 | සතුටුදායකයි |
| 3 | සතුටුදායකයි |

# <u>A කොටස</u>

## ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයේ (a) **කොටසින්** කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත. කළමනාකරණ ගිණුම්කරණය මගින් සංවිධානයකට හිමිවන වාසි දෙකක් සඳහන් කිරීම අවශ්‍ය කරන ලදී.

මෙම ප්‍රශ්නයේ (b) **කොටසින්** ලාභ විශ්ලේෂණය / සමච්ඡේද ලක්ෂ්‍ය විශ්ලේෂණය පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබේ. ඒකකවලින් සමච්ඡේද ලක්ෂ්‍ය ගණනය කිරීමත්, ඒකකවලින් සුරක්ෂිත ආන්තිකය සෙවීමත් අයදුම්කරුවන් විසින් කරනු ලැබීම අවශ්‍ය විය.

**පොදු වැරදි:**

**(a) කොටස** - සමහර අයදුම්කරුවන් කරුණු සඳහන් කිරීම වෙනුවට විස්තරාත්මක උත්තර ලබාදී තිබුණි.
- දී තිබුණ ඇතැම් උත්තර ප්‍රශ්නයට අදාල නොවිය.

**(b) කොටස** - සමහර අයදුම්කරුවන් දැනුම නොමැතිකම නිසා සමච්ඡේද ලක්ෂ්‍ය සහ සුරක්ෂිත ආන්තිකය ගණනය කර තිබුණේ නැත.

**කාර්යසාධනය: මෙම ප්‍රශ්නයේ (a) සහ (b) කොටස් සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

**පරීක්ෂක යෝජනා:**

- ➢ පෙර ප්‍රශ්න පත්‍රවල මීට සමාන ආකාරයේ ප්‍රශ්න වර්ග වැඩිපුර තෝරා උත්තර ලියා පුරුදු පුහුණු වීම.
- ➢ සංකල්ප පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට ස්ව-අධ්‍යයන පොත් අධ්‍යයනය කිරීම.

## ප්‍රශ්න අංක 02

අයවැය පාලනය පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී. සංවිධානයක අයවැයකරණ ක්‍රියාවලියේ අරමුණු දෙකක් පැහැදිලි කිරීමද, මුදල් අතිරික්තයක් පවතින අවස්ථාවකදී සංවිධානයකට අනුගමනය කළ හැකි උපායමාර්ග දෙකක් සඳහන් කිරීමද අවශ්‍ය කරන ලදී.

**පොදු වැරදි:**

සමහර අයදුම්කරුවන් අදාල නොවන උත්තර ලියා තිබුණි. උදා: ඔවුන් "දිගුකාලීන වත්කම්වල ආයෝජනය කළ යුතුය", "කාර්ය මණ්ඩලයට පරිත්‍යාග පිරිනැමිය යුතුය", ආදිය සඳහන් කර තිබුණි.

**කාර්යසාධනය: මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායක නොවිය.**

**පරීක්ෂක යෝජනා:**

- ➢ අත් අකුරු පැහැදිලිව ලියන්න.
- ➢ විෂය පිළිබඳ න්‍යායාත්මක දැනුම වර්ධනය කරගන්න.

## ප්‍රශ්න අංක 03

කාරක ප්‍රාග්ධන චක්‍රය යෙදවීම පිළිබඳව මෙම ප්‍රශ්නයේ (a) **කොටසින්** පරීක්ෂා කර ඇත. දෙනලද සමාගමේ කාරක ප්‍රාග්ධන චක්‍රයේ දින ගණන ගණනය කිරීම මෙමගින් අවශ්‍යව ඇත. අයදුම්කරුවන්ගෙන් බොහොමයක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා සම්පූර්ණ ලකුණු ලබා තිබුණේය.

සමාගමේ වෙළෙඳ ගෙවිය යුතු මුදල්හි පියවීමේ කාලය වැඩිදියුණු කිරීම සඳහා භාවිත කළ හැකි උපාය මාර්ග දෙකක් සඳහන් කිරීම ප්‍රශ්නයේ (b) **කොටසින්** අවශ්‍ය කර තිබුණි.

**පොදු වැරදි:**

තොග සහ වෙළෙඳ ලැබිය යුතු දෑ සඳහා අදාල දින ගණනය කිරීමේදී ඇතැම් අයදුම්කරුවන් වැරදීම් සිදුකර තිබුණි. සමහර අයදුම්කරුවන් කාරක ප්‍රාග්ධනය ගණනය කිරීමේදී ගෙවිය යුතු දිනයන් අඩුකරනවා වෙනුවට එකතු කර තිබුණේය. තවත් සමහර අයදුම්කරුවන් පෙරවැඩ (workings) පෙන්වා තිබුණේ නැත.

**කාර්යසාධනය: මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

**පරීක්ෂක යෝජනා:**

- න්‍යායාත්මක උත්තර නිශ්චිත විය යුතු අතර, උත්තරයට අදාල විය යුතුය.
- පෙරවැඩ පැහැදිලිව පෙන්වා තිබිය යුතුය.
- ඉකුත් විභාගවල සමාන ස්වරූපයේ ප්‍රශ්න පුරුදු පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 04

පිළිගෙවුම් කාලය භාවිත කරමින් කෙරෙන නව ආයෝජන ව්‍යාපෘතියක් ඇගයීම පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර ඇත. දෙනලද සමාගම සඳහා නව ව්‍යාපෘති ආයෝජනයේ පිළිගෙවුම් කාලය ගණනය කිරීම ද, හේතු දක්වමින් ව්‍යාපෘතිය බාරගත යුතුදැයි සඳහන් කිරීම ද මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය කර ඇත.

**පොදු වැරදි:**

- පිළිගෙවුම් කාලයේ මාස ගණන ගණනය කිරීමේදී සමහර අයදුම්කරුවන් සූත්‍රය වැරදි ආකාරයට යොදවාගෙන තිබුණි.
- මුදල් ගලාඒම ධනාත්මක නිසා ව්‍යාපෘතිය පිළිගතයුතුයැයි සමහර අයදුම්කරුවන් සඳහන් කර තිබුණේය.

**කාර්යසාධනය: මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

**පරීක්ෂක යෝජනා:**

- පිළිගෙවුම් කාලයේ මාස ගණන ගණනය කිරීමේ ක්‍රමය අධ්‍යයනය කරන්න.
- වැඩි වශයෙන් ප්‍රශ්නවලට උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතු අතර, ස්ව-අධ්‍යයන පොත් නිසි පරිදි අධ්‍යයනය කිරීම.

## <u>B කොටස</u>

### ප්‍රශ්න අංක 05

මුදල් අයවැය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාවට ලක්කොට තිබේ. දෙන ලද මාසය සඳහා මුදල් අයවැය පිළියෙල කිරීම අවශ්‍යකර ඇත. අයදුම්කරුවන්ගෙන් බොහොමයක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර, සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**පොදු වැරදි:**

- සමහර අයදුම්කරුවන් මුදල් ලැබීම් දෙනලද ප්‍රතිශත මත නිවැරදිව ගණනය කර, බොල්ණය ලෙස 2% ක් අඩුකර තිබුණි. මුදල් ලැබීම්වල මුළු ප්‍රතිශතය 98% ක් බව ඔවුනට වැටහී නොතිබුණි.
- සමහර අයදුම්කරුවන් රු.250,000/- ණය ආපසු ගෙවීම්වලට මූල්‍ය වියදම් ගලපා තිබුණි.
- සමහර අයදුම්කරුවන් ක්ෂය ඉවත් නොකොට සම්පූර්ණ පරිපාලන වියදම් ගණන්ගෙන තිබුණි. මුදල් ගැලීම් සහ මුදල් නොවන ගැලීම් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔවුනට තිබී නැත.
- ප්‍රශ්නයෙන් 2020 දෙසැම්බර් මාසයේ විස්තර පමණක් පෙරවැඩ සහිතව, අපේක්ෂා කරන ලද නමුත්, සමහර අයදුම්කරුවන් ඔක්තෝම්බර්, නොවැම්බර්, දෙසැම්බර් සහ එකතුව සහිත තීරු හතරක උත්තර පිළියෙල කර තිබුණේය. මෙයින් පෙනී යන්නේ ප්‍රශ්නයෙන් අපේක්ෂා කළ අවශ්‍යතාවය අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන නොතිබූ බවය.

**කාර්යසාධනය: මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය හොඳ මට්ටමක විය.**

**පරීක්ෂක යෝජනා:**

- උත්තර ලිවීම ආරම්භ කිරීමට පෙර ප්‍රශ්නය හොඳින් තේරුම් ගන්න.
- පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියා පුරුදු පුහුණු වන්න.
- මුදල් ගැලීම් සහ මුදල් නොවන ගැලීම් පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගන්න.

### ප්‍රශ්න අංක 06

සමාගමක සීමාකරණ සාධකයක් පවත්නා විට ප්‍රශස්ත නිෂ්පාදන මිශ්‍රය ගණනය කරන්නේ කෙසේදැයි මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත.

**පොදු වැරදි:**

- ඒකකයක විචල්‍ය පොදුකාර්ය ගණනය කිරීමේදී සමහර අයදුම්කරුවන් නුපුහුණු ශ්‍රම පැය පමණක් සලකා බලා ඇත.
- සීමාකරණ සාධකයේ දායකය ගණනය කිරීමට සීමාකරක සාධකය ලෙස ඒකකයක නුපුහුණු ශ්‍රම පැය ප්‍රමාණය ඇත.
- සමහර අයදුම්කරුවන් ඒකකයක දායකය, ඒකකයක පුහුණු ශ්‍රම පැය අවශ්‍යතාවයක් බෙදනවා වෙනුවට ගුණකර තිබුණේය.
- අයදුම්කරුවන් ස්වල්ප දෙනෙක් සූත්‍ර භාවිතයෙන් විසඳුම් සෙවීමට උත්සාහා කර තිබුණි.
- සමහර අයදුම්කරුවන් ඒකක දායකය වෙනුවට මුළු දායකය ගණනය කර තිබුණි.

**කාර්යසාධනය: මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය හොඳ මට්ටමක විය.**

**පරීක්ෂක යෝජනා:**

- උත්තර ලිවීම ආරම්භ කිරීමට පෙර ප්‍රශ්නය හොඳින් කියවා අවබෝධ කරගන්න.
- පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියා පුරුදු පුහුණු වන්න.

## ප්‍රශ්න අංක 07

පොදු සමාගමක සාමාන්‍ය කොටස් පිරිවැය, නිදහස් කළ නොහැකි වරණීය කොටස් පිරිවැය, නිදහස් කළ හැකි ණයකර පිරිවැය, වෙළෙඳපොළ අගය භාවිතයෙන් බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය (WACC) ගණනය කිරීමට අයදුම්කරුවන්ගේ ඇති හැකියාව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදි. අයදුම්කරුවන් බොහෝ දෙනෙකු සාමාන්‍ය කොටස් පිරිවැය සහ නිදහස් කළ නොහැකි වරණීය කොටස් පිරිවැය නිවැරදිව ගණනය කර සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණේය.

**පොදු වැරදි:**

- ප්‍රධාන වශයෙන් ණයකර පිරිවැය ගණනය කිරීමේදී අයදුම්කරුවන් බොහොමයක් නිවැරදි සූත්‍ර යොදාගෙන තිබුණේ නැත.
- සාමාන්‍ය කොටස් පිරිවැය ගණනය කිරීමට සහ නිකුත් කළ නොහැකි වරණීය කොටස් පිරිවැය ගණනය කිරීමට අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු වෙළෙඳපොළ මිල වෙනුවට නිකුත්කළ මිල ගෙන තිබුණේය.
- ණයකර පිරිවැය නිදහස් කළ නොහැකි ණයකර ලෙස ගණනය කර තිබුණි.
- බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය (WACC) ගණනය කිරීමේදී වෙළෙඳපොළ මිල සලකා බලා නොතිබුණි.

**කාර්යසාධනය: මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

**පරීක්ෂක යෝජනා:**

- පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියා පුරුදු පුහුණු විය යුතු අතර, ස්ව-අධ්‍යයන පාඨමාලා පොත පරිශීලනය කළ යුතුය.
- ප්‍රශ්නය හොඳින් කියවා ප්‍රශ්නයේ අවශ්‍යතාවය කුමක්දැයි මැනවින් වටහා ගන්න.

## C කොටස

## ප්‍රශ්න අංක 08

ඍජු ද්‍රව්‍ය මිල විචලනය, ඍජු ද්‍රව්‍ය මිශ්‍ර විචලනය, ඍජු ද්‍රව්‍ය ඵලදා විචලනය, ඍජු ශ්‍රම අනුපාත විචලනය සහ ඍජු ශ්‍රම කාර්යක්ෂමතා විචලනය ගණනය කරනු ලබන්නේ කෙසේදැයි මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත.

**පොදු වැරදි:**

- අයදුම්කරුවන් බොහොමයක් විචලනයන් නිවැරදි ලෙස ගණනය කර තිබුණේ නැත.
- සමහර අයදුම්කරුවන් වාසි සහ අවාසි තත්ත්වයන් වැරදි ලෙස සටහන් කර තිබුණේය.
- විචලනයන්ට අදාල ලිඛිත සූත්‍ර නිවැරදිව ලියා තිබුණද, බොහෝ අවස්ථාවන්හි සූත්‍රවලට සංඛ්‍යා ආදේශ කිරීමේදී වරදවාගෙන තිබුණි.

**කාර්යසාධනය: මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

**පරීක්ෂක යෝජනා:**

- විවිධ අවස්ථාවන් සඳහා වූ විචලනයන්ට අදාල සූත්‍ර භාවිතය ගැන අයදුම්කරුවන් පුරුදු පුහුණු විය යුතුය.
- සූත්‍ර මතකයේ තබාගෙන, සූත්‍රවලට සංඛ්‍යා ආදේශ කිරීම සඳහා සමාන පෙර ප්‍රශ්න පත්‍රවලට වැඩි වැඩියෙන් උත්තර ලියා පුරුදු පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 09

ශුද්ධ වර්තමාන අගය (NPV) භාවිත කරමින් නව ව්‍යාපෘතියක් ඇගයීම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබේ. බදු සඳහා ගැලපීම් සිදු කරමින් ශුද්ධ වර්තමාන අගය ගණනය කර ආයෝජනයේ ශක්‍යතාව තක්සේරු කිරීම අවශ්‍ය විය. ඉතා සරල ප්‍රශ්නයක් වුවද අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු පමණක් සම්පූර්ණ ලකුණු උපයාගෙන තිබුණේය.

**පොදු වැරදි:**

- සමහර අයදුම්කරුවන් ප්‍රාග්ධන දීමනාවන් නිවැරදි ලෙස ගණනය කර තිබුණේ නැත. ඔවුන් රු. මිලියන 32 ක සම්පූර්ණ ගණන ප්‍රාග්ධන දීමනාවන් ගණනය කිරීම සඳහා ගෙන ඇත.
- සමහර අයදුම්කරුවන් රු. මිලියන 32 ක මුළු ගණන ආයෝජන ලෙස ගෙන ඇති අතර, අතිරේක රු. මිලියන 9 කාරක ප්‍රාග්ධනය ලෙස ගෙන ඇත.
- ව්‍යාපෘතිය අවසානයේදී අයකර ගත යුත්තක් ලෙස රු. මිලියන 9 ක කාරක ප්‍රාග්ධනය සමහර අයදුම්කරුවන් ඇතුළත් කර තිබුණේ නැත.
- ශුද්ධ වර්තමාන අගය ගණනය කිරීමේදී, මුදල් ගැලීමක් නොවන ක්ෂය ඉවත් නොකොට ස්ථාවර පිරිවැයේ සම්පූර්ණ ප්‍රමාණය සමහර අයදුම්කරුවන් ගණන් ගෙන තිබුණේය.

**කාර්යසාධනය: මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

**පරීක්ෂක යෝජනා:**

- උත්තර ලිවීමට පෙර ප්‍රශ්නය හොඳින් කියවා අවබෝධ කරගත යුතුය.
- නිසිලෙස ඒඒටී ස්ව-අධ්‍යයන පොත පරිශීලනය කරන්න.
- මුදල් ගලා ඒම් සහ මුදල් නොවන ගලා ඒම් නිසි පරිදි නිවැරදිව හඳුනාගත යුතුය.
- පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියා පුරුදු පුහුණු වන්න.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 10

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** පෙරසැරි පිරිවැයකරණ පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබේ. සමානුපාතික ඒකක හා පිරිවැය දැක්වෙන ප්‍රකාශය සහ I වන පෙරසැරි ගිණුම පිළියෙළ කිරීම අවශ්‍ය කර ඇත. බොහොමයක් අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු හෝ සැලකිය යුතු තරමේ ලකුණු මෙම කොටස සඳහා ලබාගෙන තිබුණේය.

අපේක්ෂිත වටිනාකම මත පදනම්ව තීරණ ගැනීම මෙම ප්‍රශ්නයේ **(b) කොටසින්** පරීක්ෂාවට ලක්කර ඇත. දී ඇති සමාගම භාවිත කළ යුත්තේ කුමන අලෙවිකරණ ප්‍රයත්නයක්දැයි තක්සේරු කිරීම අවශ්‍යකර ඇත.

සමහර අයදුම්කරුවන් **(a) හෝ (b) කොටස්** අතුරෙන් එක් කොටසකට පමණක් උත්තර සපයා තිබුණේය.

**පොදු වැරදි:**

**(a) කොටස:**

- සමහර අයදුම්කරුවන් සමානුපාතික ඒකක ගණනය කිරීමේදී සාමාන්‍ය අපතය සැලකිල්ලට ගෙන ඇත.
- සමහර අයදුම්කරුවන් ඒකක පිරිවැය ගණනය කිරීමේදී ඍජු ද්‍රව්‍ය පිරිවැයෙන් සාමාන්‍ය අපතයේ වෙළෙඳ වටිනාකම අඩුකර තිබුණේ නැත.
- සමහර අයදුම්කරුවන් පෙරසැරි ගිණුම පමණක් පිළියෙල කර ප්‍රශ්නයේ මුලින් දී තිබූ ද්‍රව්‍ය පිරිවැය, ඍජු ශ්‍රමය සහ විචල්‍ය පොදුකාර්ය ගණන් ඇතුළත් කර තිබුණි.

**(b) කොටස:**

- සමහර අයදුම්කරුවන් අපේක්ෂිත විකුණුම් මිල සම්භාවිතාවයෙන් ගුණකර තිබුණේය.
- සමහර අයදුම්කරුවන් තීරණයකට එළඹීමේදී විචල්‍ය පිරිවැය නොසලකා හැර, අපේක්ෂිත විකුණුම්වලට සම්භාවිතාව යොදවා ස්ථාවර පිරිවැය අඩුකර තිබුණේය.
- සමහර අයදුම්කරුවන් මුළු විකුණුම් එකතුව ගෙන මුළු විකුණුම් මිලෙන් ඒකකයක් රු.1,150/- ක් බැගින් වූ විචල්‍ය පිරිවැය අඩුකර අපේක්ෂිත මුළු විකුණුම් ඒකක ගණනින් ගුණකර ඇත.

**කාර්යසාධනය: මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

**පරීක්ෂක යෝජනා:**

- සංකල්පය ගැන පැහැදිලි අදහසක් ඇතිකර ගැනීම සඳහා ඒඒටී ස්ව-අධ්‍යයන පොත හා සමාන පෙළ පොත් අධ්‍යයනය කරන්න.
- උත්තර ලිවීම ආරම්භ කිරීමට පෙර ප්‍රශ්නය හොඳින් තේරුම් ගන්න.
- සමාන වර්ගයේ ප්‍රශ්න සහ ඒඒටී ස්ව-අධ්‍යයන පොතේ දී තිබෙන උදාහරණ පුරුදු පුහුණු වන්න.

\- - -

<u>**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**</u>

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.
2. ප්‍රශ්නය කිහිප වතාවක් මනා අවධානයකින් කියවිය යුතු අතර, අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.
3. ප්‍රශ්න වලට උත්තර සැපයීමේදී උපකල්පනයන් කර ඇත්නම් ඒවා පැහැදිලිව පෙන්විය යුතුය.
4. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.
5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.
6. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා යෝජිත උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය. සමාන රටාවන්ගෙන් හා ව්‍යුහයන්ගෙන් යුත් ප්‍රශ්න නැවත නැවත විභාගයන්හිදී පරීක්ෂා කළ හැකි බැවින් මෙම ක්‍රමය අනුගමනය කිරීම වාසිදායකය.
7. ස්ව-අධ්‍යයන පාඩම්මාලා අධ්‍යයනය කිරීම හා එහි ඇති උත්තර පරිශීලනය කිරීම ඉතා වැදගත්ය.
8. මෙම විෂය සම්බන්ධව ඇති පොත්පත්, සඟරා හා ලිපි ආදිය පරිශීලනය කළ යුතුය.
9. විභාගයේදී කාලය මනාව කළමනාකරණය කර ගැනීම. එක් එක් ප්‍රශ්නයට වෙන්කර ඇති ලකුණු මගින් ඒ සඳහා වෙන්කළ යුතු කාලය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.
10. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -